| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2024 |
| **10 ශ්‍රේණිය** | **නර්තනය - II** |

නම/ විභාග අංකයඃ ......................................... කාලය ;- පැය 1 යි

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

01)

i. කරුණා රසය ජනිත වන්නේ ............................................ නැමැති භාවය මගිනි.

ii. කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ ප්‍රථම නිෂ්පාදන වර්ෂය වන්නේ ..........................................

iii. සැවුලා වන්නමේ බෙර පදය ........................................................................

iv. ...................... දෙවියන් ඇදහීමට ආරම්භ වූ පූජෝත්සවයක් ලෙස ද සොකරි නාටකය හැඳින්වේ.

v. සොකරි නාටකයේ රඟමඩල ලෙස ........................................................ යොදා ගනී.

vi. ආධුනික බෙරවාදන ශිල්පියාට ප්‍රගුණ කිරීම සඳහා හස්ත සාධන අභ්‍යාස ............................................ පවතී.

vii. "අටවිසි මුනිඳු බලෙන් අප හට අවසර ලැබෙනු සබෙන්" මෙය ........................................... කවියකි.

viii. ...................... බුදු සමය ව්‍යාප්තවීමෙන් පසු ක්‍රමයෙන් බෞද්ධ මුහුණුවරක් ගත් වාදන ක්‍රමයකි.

ix. පූජාර්ථය සඳහා අත් රබාන භාවිත කළ අවස්ථා දෙකකි.
   i. ................................................ ii. ................................................

x. සොබමන් දෙවිවරු සදෙනෙක් ... යන ගායනය (1)................................................ තාලරූපයට අයත් වේ. චාමර නැටීමේදී එම කවි වලට අමතරව රාජ සහා ලක්ෂණ ගත් නිසා (2)................................... කවි ද යොදා ගනී.

02)

i. සිංහරාජ වන්නමේ බෙර පදය අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.

ii. "අතකට ගෙන රබන් පොඩිය ගසති දිසිරුවින්" යන කවි පදය නියමිත තාල රූපයට ප්‍රස්තාර ගත කරන්න.

iii. සැවුලා වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

03) පහත සඳහන් මාතෘකා තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ඔන්චිලි වාරම්

ii. පංච තූර්ය වාදනය

iii. මළ බෙර වාදනය

iv. නාට්‍ය ශෛලීන්

v. ශාරීරික ස්වස්ථතාවයට නර්තනයෙන් ලැබෙන දයකත්වය

04)

i. (1) පහත ග්‍රන්ථවල කතුවරුන් නම් කරන්න.
   (අ) විදේශීන් දුටු ශ්‍රී ලංකාව (ආ) එදා හෙළදිව
   (2) පහත සිදුවීම්ලට අදළව එම කාර්යය කළ රජතුමා නම් කරන්න.
   (අ) නගර නිර්මාණයේදී නාට්‍ය ශාලා ඉදිකිරීම
   (ආ) බෝධි ස්නාන පූජාව සඳහා තූර්යවාදන පැවැත්වීම

ii. මහනුවර යුගයේ විමලධර්මසූරිය රජ සමයේ ලංකාවට පැමිණි දේශාටකයාගේ වාර්තාව ඇසුරින් මහනුවර පෙරහැරේ නර්තන පිළිබඳව අපට ගත හැකි නිගමන විස්තර කරන්න.

iii. ශ්‍රෝත්‍රික ජනතාව අතර නර්තන කලාව ප්‍රචලිතව පැවති බවට සාධකයක් විස්තර කරන්න.

05)

i. කරදිය හා කුඹී කතාව මුද්‍රා නාට්‍ය ඇසුරින් පහත වගුව පුරවන්න.

| **මුද්‍රා නාට්‍යය** | **රංග රචනය** | **සංගීත නිර්මාණය** |
|---|---|---|
| කරදිය | | |
| කුඹී කතාව | | |

ii. කරදිය හෝ කුඹී කතාව මුද්‍රා නාට්‍යට තේමා කරගත් කතා පුවතෙන් සමාජයට ලබා දෙන ආදර්ශ පැහැදිලි කරන්න.

iii. කරදිය මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණය මගින් ධීවර ජනතාවගේ ස්වභාවය විදහා දක්වෙන ආකාරය විස්තර කරන්න.

06)

i. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි නාටක 4 නම් කරන්න.

ii. සොකරි නාටකයේ වාදනය පිළිබඳ විස්තර කරන්න.

iii. සොකරි නාට්‍ය සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ඉදිරිපත් කරන්න.

07)

i. අංග රචනා කිරීමේ විධි ක්‍රම හතර නම් කරන්න.

ii. අංග රචනා ද්‍රව්‍ය හතර නම් කර ඒවා භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

iii. ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමට නර්තනයෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් විස්තර කරන්න.